**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය - 2024**

**--------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය වියාචනය

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ (“මණ්ඩලය’’) 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, අරමුදල් හා සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මාගේ වාර්තාවේ මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන්, මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය වියාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ, අරමුදල් හා සංචිත වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය.

මෙම කරුණු හේතුවෙන්, වාර්තා කළ හෝ වාර්තා නොකළ මුදල් සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, අරමුදල් හා සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සම්බන්ධයෙන් කිසියම් ගැළපීමක් අවශ්‍ය වී ඇත්දැයි මට තීරණය කිරීමට නොහැකි විය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලය මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මණ්ඩලය මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 02 හි 09 වන ඡේදය ප්‍රකාරව පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට තොගය අගය කළ යුතු වුවද, අවසන් තොගයේ ශුද්ධ උපලබ්ධි අගය ලබාගැනීමෙන් තොරව රු.90,344,597 ක පිරිවැයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2025 වර්ෂයේ සිට අවසාන තොගයේ ශුද්ධ උපලබ්ධි අගය හෝ පිරිවැය අගය යන දෙකෙන් අඩු අගයට තොගය අගය කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 02 ප්‍රකාරව පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට තොගය අගය කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 12 හි 77 ඡේදය ප්‍රකාරව සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ලාභය හෝ අලාභය ඉපයීමට අදාළ බදු වියදම ලාභය හෝ අලාභයේ කොටසක් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ඉදිරිපත් කළ යුතු වුවද, මණ්ඩලය විසින් බදු වියදම ගණනය කර ලාභයට එරෙහිව ගළපා නොතිබුණි. | 2025 මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කර ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 12 ප්‍රකාරව ලාභය හෝ අලාභය ඉපයීමට අදාළ බදු වියදම ලාභය හෝ අලාභයේ කොටසක් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 79(ආ) ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති නමුත් තවදුරටත් භාවිතා කරනු ලබන පිරිවැය රු.360,329,234 ක් වූ වත්කම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2025 මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කර ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති නමුත් තවදුරටත් භාවිතා කරනු ලබන වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 ප්‍රකාරව හෙළිදරව් කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 20 හි 12 ඡේදය ප්‍රකාරව රජයේ ප්‍රදාන එම ප්‍රදානයෙහි ප්‍රතිලාභ ලැබීමට | 2025 අවසාන ගිණුම් මගින් මෙම ප්‍රදාන ක්‍රමක්ෂය කරනු ලැබේ . | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 20 ප්‍රකාරව රජයේ ප්‍රදාන එම |

| | | | |
|---|---|---|---|
| | අදහස් කරන කාල සීමාව තුළ ක්‍රමානුකූල පදනමක් මත ලාභ හෝ අලාභය ගණනය කිරීමේදී හඳුනාගත යුතු වුවත්, වර්ෂ ගණනාවක සිට විවිධ කාර්ය ඉටුකිරීම සඳහා ලැබී තිබූ රු.27,509,000 ක් වූ ප්‍රදාන වර්ග 05ක්, සමාලෝචිත වර්ෂයේදී ද ක්‍රමක්ෂය කර නොතිබුණි. | | ප්‍රදානයෙහි ප්‍රතිලාභ ලැබීමට අදහස් කරන කාල සීමාව තුළ ක්‍රමානුකූල පදනමක් මත ලාභ හෝ අලාභය ගණනය කිරීමේදී හඳුනාගත යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 24 හි 16 සහ 17 ඡේද ප්‍රකාරව සම්බන්ධිත පාර්ශව වෙත ගෙවන ලද පාරිශ්‍රමික හා අනෙකුත් දීමනා පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවත් ආයතනයේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ එම තොරතුරු හෝ සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙණු සිදු නොවූ බවට මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | සම්බන්ධිත පාර්ශව වෙත ගෙවන ලද පාරිශ්‍රමික හා අනෙකුත් දීමනා පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 24 ප්‍රකාරව හෙළිදරව් කළ යුතුය. |
| (ඊ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 හි 42 ඡේදය ප්‍රකාරව පෙර කාලපරිච්ඡේද වැරදි නිවැරදි කිරීමේදී සංසන්දනාත්මක අගයයන් නැවත ප්‍රකාශ කළ යුතු වුවත් එකතුව රු.86,965,997 ක් වූ ඉකුත් කාල පරිච්ඡේද වැරදි 304 ක් නිවැරදි කිරීමේදී සංසන්දනාත්මක අගයයන් නැවත ප්‍රකාශකර නොතිබුණි. තවද ප්‍රමිතියේ 49 වන ඡේදය ප්‍රකාරව වැරදි නිවැරදි කිරීමට අදාළ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2025 මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 හි 42 ඡේදයට අනුකූලව ඉදිරිපත් කිරීමට පියවර ගනු ලැබේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 ප්‍රකාරව පෙර කාලපරිච්ඡේද වැරදි නිවැරදි කිරීමේදී සංසන්දනාත්මක අගයයන් නැවත ප්‍රකාශ කළ යුතු අතර වැරදි නිවැරදි කිරීමට අදාළ තොරතුරු ප්‍රමිතියේ 49 වන ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සේවක ප්‍රතිලාභ බැඳීම් ගණනයේදී ආයුගණක උපකල්පන භාවිතා කරනු ලබන බව මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර තිබුණ ද, ඒ අනුව නිවැරදිව ගණනය කිරීම් සිදු කර නොතිබීම හේතුවෙන් රු.164,031,441 ක් විය යුතු සේවක ප්‍රතිලාභ වගකීම රු.210,861,835 ක් | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | සේවක ප්‍රතිලාභ බැඳීම මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කරඇති පරිදි ආයුගණක උපකල්පන භාවිතා කර නිවැරදිව ගිණුම් ගතකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලෙස ගණනය කර තිබුණි. මේ හේතුවෙන් සේවක ප්‍රතිලාභ වගකීම රු.46,830,394 කින් සහ වර්ෂයේ අලාභය රු.3,891,850 කින් වැඩියෙන්ද වෙනත් විස්තීර්ණ ආදායම් රු.42,938,544 කින් අඩුවෙන්ද දක්වා තිබුණි. | | |
| (ආ) | මණ්ඩලයට අයත් උණවටුන සිලෝන් ප්ලාසා හා කෞතුකාගාර ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ සමාලෝචිත වර්ෂය අවසානයට ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු.46,168,392 ක මුදලක් සහ ලී බඩු මිලදී ගැනීම සඳහා රු.434,606 ක මුදලක් වැය කර තිබූ අතර ඊට අදාළ ආදායම් හා වියදම් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් කෙරීගෙන යන වැඩ රු.46,163,392 කින්, ලී බඩු සහ උපකරණ රු.434,606 කින් සහ රජයේ ප්‍රදාන රු.46,602,998 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ගාල්ල දිස්ත්‍රික් ලේකම් විසින් අලෙවි අංශය වෙත යොමු කර ඇති තොරතුරු මුදල් අංශය වෙත යොමු නොකිරීම නිසා මෙම අගයයන් ගිණුම් වලින් මගහැරී ඇත. මෙම දේපළෙහි වටිනාකම තක්සේරු කිරීමට නියමිත බැවින් ගිණුම් ඒ අනුව යාවත්කාලීන කරනු ලැබේ. | මණ්ඩලයට අයත් වත්කම් වලට අදාළ සියලු ආදායම් හා වියදම් ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | 2024 දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් කර තිබුණු, රු.1,911,259 ක් පිරිවැය වූ අච්චුවේලි කාර්මික ජනපදයේ පිහිටි ආපනශාලාවේ, තැපැල් කාර්යාලයෙහි සහ ලිඳෙහි ඉදිකිරීම් කටයුතු, රු.20,555,200 ක් වැය කර තිබූ Ceylon Plaza විද්‍යුත් වෙබ් අඩවිය සහ රු.5,890,041 ක් වැය කර තිබූ ආහාර රසායනාගාරය බෙදා වෙන් කිරීමට අදාළව දරන ලද වියදම් ප්‍රාග්ධනිත නොකර කෙරීගෙන යන වැඩ වශයෙන් දක්වා තිබීමෙන් රු.28,356,500 ක් වූ දේපළ පිරියත උපකරණ අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද මෙම වත්කම් ක්ෂය කර නොතිබීමෙන් ක්ෂය වියදම රු.1,432,612 ක් අඩුවෙන් දැක්වීම හේතුවෙන් ඌණතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද රඳවාගත් ඉපයීම් රු.589,004 කින් වැඩියෙන් ද, ක්ෂය වෙන් කිරීම් රු.2,021,616 කින් අඩුවෙන් ද දක්වා තිබුණි. | අදාළ ඉදිකිරීම් කටයුතු අවසන් කල දින තහවුරු කරගෙන සියලු අඩුපාඩු 2025 මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | මූල්‍ය වර්ෂයේ අවසන් දිනට වැඩ අවසන් කරන ලද ඉදිකිරීම් සඳහා දරන ලද වියදම් ප්‍රාග්ධනිත කිරීමටත් ඊට අදාළ ක්ෂය වෙන් කිරීම් සිදුකිරීමටත් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | අච්චුවේලි කාර්මික ජනපදයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ජාතික යන්ත්‍රෝපකරණ දෙපාර්තමේන්තුව වෙත 2018 වර්ෂයේදී රු.7,251,379 ක් ගෙවා තිබුණ ද ඉදිකිරීම් සිදු වී නොමැති වීම හේතුවෙන් අත්තිකාරම් ලෙස දැක්විය යුතු වියදම සාවද්‍ය ලෙස කෙරීගෙන යන වැඩ වශයෙන් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අදාළ කොන්ත්‍රාත්තුවෙන් 20% ක අත්තිකාරම් මුදලක් ලබාදීමට කටයුතු කර ඇත. පසුව මෙම ආයතනය ඉදිකිරීම් කටයුතු නිසි පරිදි ආරම්භ කර නොතිබූ අතර, ගිවිසුම්ගත කාලසීමාව ඉක්මවා ගියද කාර්යය ඉටු කර නොතිබුණි. ඉදිකිරීමේ කාර්ය අවසන් කර නොමැති බව තහවුරු කර ඇති නිසා කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ගිණුමෙහි ඉදිරියට ගෙන එන ශේෂයක් ලෙස ඇතුලත් කර ඇත. | ඉදිකිරීම් සඳහා අත්තිකාරම් ලබාදී තිබුණද ඉදිකිරීම් සිදුවී නොමැති අවස්ථාවකදී අදාළ මුදල අත්තිකාරම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. අත්තිකාරම් පියවා ගැනිමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය විසින් ඒකල කාර්මික ජනපදයේ ඉදිකරන ලද මායිම් තාප්පයක් සඳහා දරා තිබුණු රු.3,002,725 ක පිරිවැය ප්‍රතිපූර්ණය කරන ලෙස දන්වා 2024 නොවැම්බර් 27 දින එවන ලද ඉන්වොයිස් පත්‍රය ගිණුම්ගත නොකිරීම හේතුවෙන් වත්කම් හා ගෙවිය යුතු ශේෂය රු.3,002,725 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉංජිනේරු අංශය ලබා දෙන වාර්තාවේ මෙම ඉදිකිරීමට අදාලව කිසිදු තොරතුරක් ඇතුළත් නොවන අතර මේ දක්වා කිසිදු ගෙවීමක් ද වාර්තා වී නොමැති හෙයින් ගිණුම්වලින් මඟහැරී ඇත. කරුණු සොයා බලා 2025 මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | ඉදිකිරීම් හා ප්‍රතිපූර්ණය කළ යුතු පිරිවැය මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව හඳුනාගත යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද ජාත්‍යන්තර කර්මාන්ත ප්‍රදර්ශනයේ ශාලා ගාස්තු ගෙවීම සඳහා කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයෙන් ලද රු.25,000,000 ක් ආදායම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට කර්මාන්ත ප්‍රදර්ශන වියදම් ගිණුමට බැර කිරීම හේතුවෙන් ආදායම් සහ වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ශාලා ගාස්තු වියදම්වලින් කොටසක් ආවරණය කර ගැනිම සඳහා රු.මිලියන 25 ක් රේඛීය අමාත්‍යාංශය විසින් සෘජුව උක්ත ආයතනය නමට ලියන ලද චෙක්පතක් මඟින් ලබා දී ඇත. ගිණුම් සකස් කිරීමේදී ඉහත අයපත, වියදම් ගිණුමට හර කර තිබූ අතර රේඛීය අමාත්‍යාංශයෙන් සෘජුව ලද හෙයින් ඉහත රු. මිලියන 25 ක මුදල එම ගිණුමට බැර කර ඇත. | වියදම් පියවා ගැනිම සඳහා ලද මුදල් ප්‍රතිපාදන ලැබීම් ලෙස ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | බැංකු ගිණුමට සෘජු ප්‍රේෂණ වශයෙන් ලැබී ජංගම වගකීම් යටතේ දක්වා තිබූ රු.8,704,243 ක ආදායම් නිවැරදිව හඳුනාගෙන අදාළ ආදායම් ගිණුම්වලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | ජංගම ගිණුම් වලට බැර වී සමාලෝචිත වර්ෂය තුළදී ලැබීම් හඳුනාගැනීම සඳහා කරන ලද සියළු ප්‍රයත්නයන් අසාර්ථක වූ තැන්පතු මෙලෙස එක් ගිණුමකට රැස්කර ඇත. පසුව මුදල් රෙගුලාසි ප්‍රකාරව ආදායමට බැර කරනු ලැබේ. | බැංකු ගිණුමට ලැබෙන සෘජු ප්‍රේෂණ මුදල් නිවැරදිව හඳුනාගෙන අදාළ ආදායම් ගිණුම්වලට බැර කිරීමට සුදුසු ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට ආයෝජන දේපළ යටතේ හඳුනාගෙන තිබූ ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම් ශේෂය තුළ ඇතුළත් රු.585,052,750 ක් වූ ප්‍රත්‍යාගණිත ආයෝජන දේපළ මත ක්ෂය ගණනය කිරීමේදී ප්‍රත්‍යාගණිත අගය වෙනුවට පිරිවැය මත ක්ෂය ගණනය කිරීම හේතුවෙන් රු.13,192,683 කින් වර්ෂයේ ක්ෂය වියදම අඩුවෙන් දක්වා තිබුණි. | නැවත ආයෝජන දේපළ යටතට ගැනෙන ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීමක් සිදු වන බැවින් එම කාර්ය අවසාන වූ පසු මූල්‍ය ප්‍රකාශන යාවත්කාලීන කරනු ලැබේ. | ප්‍රත්‍යාගණිත ආයෝජන දේපළ මත ක්ෂය ගණනය කිරීමේදී ප්‍රත්‍යාගණිත අගය මත ක්ෂය ගණනය කළ යුතුය. |
| (එ) | මණ්ඩලය විසින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ ඒකාබද්ධව කර්මාන්ත සංවර්ධන ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කර, කර්මාන්ත ණය අරමුදල නමින් බැංකු ගිණුමක් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පවත්වාගෙන ගොස් තිබුණි. එම ගිණුම් ශේෂය ජංගම වත්කම් යටතේ දක්වා තිබියදී නිවැරදි නොවන ලෙස රු.16,922,801 ක් රඳවාගත් ඉපයීම් ශේෂයට, රු.3,818,242 ක් වියදම් ගිණුම් 2 කට හා රු.1,915,131 ක් ආදායම් ගිණුම් 4 කට හර කර කර්මාන්ත සංවර්ධන අරමුදල් ගිණුමට රු.32,656,173 ක් බැර කර එම ගිණුම ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. | නිරීක්ෂණයේ සඳහන් සියළු ගිණුම්කරණ සටහන් 2025 මූල්‍ය ප්‍රකාශන මඟින් ආපසු හැරවීමට පියවර ගනු ලැබේ. | සාවද්‍ය ලෙස සටහන් කර ඇති ගිණුම් සටහන් නිවැරදි කළ යුතුය. |
| (ඒ) | සමාලෝචිත වර්ෂයට අදාළ සමාජ ආරක්ෂණ බදු වියදම විගණනයේ ගණනය කිරීම් අනුව රු.8,983,328 ක් වූ අතර එය මූල්‍ය ප්‍රකාශන තුළ රු.14,483,534 ක් වශයෙන් දක්වා තිබීම හේතුවෙන් රු.5,500,206 ක වෙනසක් ද රු.707,786 ක් වූ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු බදු රු.2,017,014 ක් | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | බදු වියදම හා ගෙවිය යුතු බදු වියදම අදාළ පනත් ප්‍රකාරව නිවැරදිව ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වශයෙන් දක්වා තිබීමෙන් රු.1,309,228 ක වෙනසක්ද පැවතුණි. | | |
| (ඔ) | රබර් සංවර්ධන මධ්‍යස්ථානයේ ආදායම මූල්‍ය ප්‍රකාශන අනුව රු.39,117,075 ක් වුවද විගණනයේ ගණනය කිරීම අනුව එය රු.32,736,452 ක් වීමෙන් රු.6,298,334 ක වෙනසක් පැවතුණි. | 2025 මූල්‍ය ප්‍රකාශවල අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට කටයුතු කරමි. | ආදායම් නිවැරදිව ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල (රු.) | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ජ'නල් වවුචරවලට අදාළ ගණුදෙනු සහ පෙර වර්ෂ ගැළපීම් | 351,258,273 | උපයෝගී ලේඛන සහ ගණුදෙනු හා සම්බන්ධ විස්තරය (Narration) | උප ලේඛන සමඟ ජ'නල් සටහන් පසුව ඉදිරිපත් කරනු ලැබේ. 2025 වර්ෂය සඳහා මාසික පදනමින් ජ'නල සටහන් ලිපිගොනු ගත කොට විගණනයට ඉදිරිපත් කරනු ඇත. | ජ'නල් වවුචරවලට අදාළ ගණුදෙනු සහ පෙර වර්ෂ ගැළපීම් සඳහා උපයෝගී ලේඛන සහ ගණුදෙනු විස්තර විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 05 කට අධික කාලයක සිට පැවත එන රු.12,317,092 ක් වූ පෙර ගෙවුම් ශේෂ නිරවුල් කර ගැනීමට, රු.14,268,336 ක් වූ වෙළඳ සහ වෙනත් ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට හා විශේෂ ව්‍යාපෘති 4 ක් වෙනුවෙන් කර්මාන්ත අමාත්‍යාංශයෙන් ලැබිය යුතු වර්ෂ 02ක කාලයක සිට පැවතෙන රු.9,373,908 ක් වූ ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | අංශ සමඟ සම්බන්ධ වී ශේෂ නිරවුල් කිරීමටත්, නිරවුල් කර ගැනීමට ප්‍රමාණවත් තොරතුරු නොමැති දීර්ඝ කාලයක් තිස්සේ ගිණුම්වල ඉදිරියට එමින් පවතින ශේෂ ගිණුම්වලින් කපා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමටත් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | පෙර ගෙවුම් ශේෂ නිරවුල් කර ගත යුතු අතර ලැබිය යුතු ශේෂ නොපමාව අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 05 කට අධික කාලයක සිට පැවත එන රු.19,678,888 ක් වූ වෙළඳ ණයහිමියන් යටතේ ගෙවිය යුතු ශේෂ හා වර්ෂ 03 කට අධික කාලයක සිට පැවත එන රු.20,981,281 ක් වූ වෙනත් ණය හිමියන් සහ උපචිත වියදම් ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | ඇතැම් ශේෂ අමාත්‍යාංශ අරමුදල් ප්‍රතිපූර්ණයෙන් ගෙවිය යුතුව ඇත. ණයහිමි ශේෂ සම්බන්ධයෙන් අදාල ආයතන විමසා ගිණුම් නිරවුල් කිරීමට පියවර ගනු ලැබේ. | ගෙවිය යුතු ශේෂ නොපමාව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනතේ 2(1) හා 102 වගන්ති | මණ්ඩලය ආදායම් බදු සඳහා ලියාපදිංචි වීමට හෝ බදු නිදහස් කරගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මේ සම්බන්ධව කටයුතු කරනු ලැබේ. | ආදායම් බදු සඳහා ලියාපදිංචි වීමට හෝ බදු නිදහස් කරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 21 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ අයවැය චක්‍රලේඛ අංක 03/2021 | රජයේ ආයතන සඳහා වාහන මිලදී ගැනීම් අත්හිටුවා තිබියදී මණ්ඩලයේ නිලධාරීන්ට ප්‍රවාහන පහසුකම් සලසා දීමේ අරමුණින් රු.10,750,000 ක් පිරිවැය වූ ආසන 40 කින් සමන්විත මගී බස් රථ දෙකක් 2023 හා 2024 වර්ෂයන්හිදී මණ්ඩලය විසින් මිලදී ගෙන තිබුණු අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහ භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | පසුව පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | වාහන මිලදී ගැනීම් සිදු කිරීමේදී චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතුය. |
| (ඇ) | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 03(vii) වගන්තිය | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිසි අනුමැතියකින් තොරව නව බඳවාගැනීම් සිදු නොකළ යුතු වුවද 2023 වර්ෂයේදී කොන්ත්‍රාත් පදනමින් | පසුව පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | බඳවාගැනීම් සිදු කිරීමේදී චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු |

| | | | | |
|---|---|---|---|---|
| | සහ 2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 12.5 වගන්තිය | නිලධාරින් 106 දෙනෙකු බඳවාගෙන ඉන් 61 දෙදෙනෙකු ස්ථිර කර තිබුණි. 2024 වර්ෂය තුළ කොන්ත්‍රාත් පදනමින් සේවකයන් 41 දෙනෙකු බඳවාගෙන ඉන් 32 දෙනෙකු සහ 2024 වර්ෂයට පෙර කොන්ත්‍රාත් පදනමින් බඳවාගත් සේවකයින් 32 දෙනෙකු වශයෙන් සේවකයින් 64 දෙනෙකු සේවයේ ස්ථිර කර තිබුණි. | | අනුමැතිය ලබාගත යුතුය. |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වාදෙන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතෙහි 3.4 (ix) ඡේදය හා ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 13.3 වගන්තිය | වැඩ බැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වුවද 2024 දෙසැම්බර් 31 දින වන විට අවුරුදු 01 සිට අවුරුදු 05 දක්වා කාල සීමාවක් සඳහා නිලධාරීන් 19 දෙනෙකු වැඩ බැලීමේ පදනමින් සේවයේ යොදවා සමාලෝචිත වර්ෂය තුළ රු.3,179,020 ක් වැඩ බැලීමේ දීමනා ගෙවා තිබුණි | පසුව පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | නිත්‍ය පත්වීම් කඩිනමින් සිදුකර වැඩ බැලීමේ පදනමින් සේවයේ යොදවා ගැනීමේ කාලය අවම කළ යුතුය. |
| (ඉ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දෙන ලද රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.6 වගන්තිය | සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2025 අගෝස්තු 19 දින එනම්, මාස 05 කට වැඩි කාල ප්‍රමාදයකින් පසු විගණනයට ඉදිරිපත් කර තිබුණි. | ඉදිරියේදී නියමිත දිනට ලබා දීමට කටයුතු කරමි. | ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් තුළ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.58,575,270 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 16,596,485ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.75,171,755 ක පිරිහීමක්

නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආදායම රු.57,463,192 කින්, වැඩිවීම සහ විකුණුම් හා බෙදාහැරීමේ පිරිවැය රු.92,337,628 කින් අඩුවීමට එරෙහිව විකුණුම් හා සේවා පිරිවැය හා පරිපාලන වියදම් පිළිවෙලින් රු.64,247,709 කින් හා රු.103,266,266 කින් වැඩිවීමත් රජයේ පුනරාවර්තන ප්‍රදාන රු.98,195,000 කින් අඩුවීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගණුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සේවක පැමිණීම හා පිටවීම සටහන් කිරීම සහ වැටුප් සකස් කිරීම ඇතුළු කාර්යයන් ඉටුකර ගැනීම සඳහා 2023 වර්ෂයේ දී රු.4,900,000 ක වටිනාකමකින් යුත් නව පද්ධතියක් මිලදී ගෙන තිබුණ ද තාක්ෂණික දූර්වලතා හේතුවෙන් 2024 අගෝස්තු සිට පැමිණීම, පිටවීම සටහන් කිරීම එතෙක් පැවැති ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින්ම සිදු කර තිබුණි. ඒ අනුව නව පද්ධතියේ භාවිතය අවම වී තිබුණු අතර එමඟින් ඉටු කර ගත හැකිව තිබූ කඩදාසි භාවිතය අවම කිරීම, දිස්ත්‍රික් කර්යාලවලින් ප්‍රධාන කාර්යාලයට සේවාවක් ඉල්ලුම් කරන කර්මාන්තකරුවන්/ පුද්ගලයින් සම්බන්ධීකරණය කිරීම විමසුම් හා පැමිණිලි ඉදිරිපත් කිරීම (Inquiry/ Grievance) යන කාර්යයන් ඉටුකරගත නොහැකි වී තිබුණි. | පසුව පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | තාක්ෂණික දූර්වලතා මඟහරවාගෙන පද්ධතියෙන් අපේක්ෂිත කාර්ය ඉටු කර ගැනීමට හෝ යථාවත් කළ නොහැකි නම් වගකිවයුතු පාර්ශවයන්ගෙන් අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අපනයන කේන්ද්‍රීය නිෂ්පාදන ආර්ථිකයක් උදෙසා රට බලාත්මක කිරීමට විද්‍යුත් මාධ්‍ය ඔස්සේ දැනුම හා තොරතුරු සම්ප්‍රේෂණය අරමුණු කරගනිමින් 2023 නොවැම්බර් 21 දින සිට Industry TV නමින් මුදල් ගෙවා නැරඹීමේ පහසුකම සහිත රූපවාහිනී නාලිකාවක්, ශක්‍යතා අධ්‍යනයක් සිදුකිරීමකින් තොරව ආරම්භකර තිබූ අතර මේ සඳහා 2024 සැප්තැම්බර් 30 දින වන විට රු.17,893,405 ක් මණ්ඩලය විසින් වැය කර තිබුණ ද 2024 ඔක්තෝබර් 16 වන දින සිට නාලිකාවේ විකාශන කටයුතු අත්හිටුවා තිබුණි. | මෙම නාලිකාවට අදාළ මූලික කටයුතු ඉහල කළමණාකාරීත්වය යටතේ සිදු කර ඇත. ශක්‍යතා අධ්‍යයනයන් සිදු කිරීමට කටයුතු කර නොමැත. කර්මාන්තකරුවන්ට අදහස් ප්‍රකාශ කිරීමට සහ මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන විවිධ වැඩසටහන් පිළිබඳ දැනුවත් කිරීම සඳහා මෙම නාලිකාව මගින් කටයුතු කර ඇත. මේ වන විට නාලිකාව වසා දමා ඇත. | ශක්‍යතා අධ්‍යයනය කින් පසු මෙවැනි ආයෝජනයන් සිදුකළ යුතු අතර රූපවාහිනී නාලිකාව අපේක්ෂිත කාර්ය ඉටු කර ගැනීමට භාවිතා කළ යුතු වේ. භාවිතා කිරීම ආර්ථික නොවන්නේනම් වෙනත් ආර්ථිකමය ආකාරයකට අදාළ නාලිකාව විධිමත් පරිදි පවරා දීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කර්මාන්තකරුවන්ගේ ගැටළුවලට කඩිනමින් විසඳුම් ලබාදීමේ අරමුණින් 2023 ජනවාරි සිට 1995 නම් ක්ෂණික ඇමතුම් දුරකථන සබඳතාවක් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙතින් ලබා ගෙන තිබුණු අතර මෙම දුරකථන සම්බන්ධතාවය ස්ථාපිත කිරීම හා දුරකථන ගාස්තුව වශයෙන් 2023 ජනවාරි මස සිට 2024 ඔක්තෝබර් දක්වා රු.3,057,278 ක් ගෙවා තිබුණ ද 2024 නොවැම්බර් 04 දින සිට ඇමතුම් අංකය විසන්ධි කර තිබීම හේතුවෙන් අදාළ අරමුණ ඉටුවී නොතිබුණි. | පසුව පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ඇමතුම් අංකය ක්‍රියාත්මක කර අදාළ අරමුණ ඉටු කර ගැනීම සඳහා භාවිතා කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඈ) | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ නිෂ්පාදන, අතරමැදියන්ගේ මැදිහත්වීමෙන් තොරව දේශීය සහ ජාත්‍යන්තර වෙළඳපල වෙත විවර කරමින් දේශීය නිෂ්පාදකයාට අලෙවි පහසුකම් සැපයීම අරමුණු කරගනිමින් මණ්ඩලය විසින් Ceylon Plaza නමින් විද්‍යුත් වාණිජ්‍ය වෙබ් අඩවියක් සහ ජංගම දුරකථන යෙදවුමක් පෞද්ගලික ආයතනයක් වෙතින් සංවර්ධනය කර ගැනීම සඳහා රු.20,555,200 ක මුදලක් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය සහ රේඛීය අමාත්‍යාංශ අනුමැතියකින් තොරව වැයකර තිබුණි. මේ සම්බන්ධව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම සහ අලෙවිකරණ සැලැස්මක් සකස් කිරීම සිදු කර නොතිබුණු අතර 2024 ජුනි මාසයේ සිට 2025 පෙබරවාරි 07 දක්වා කාල සීමාව තුල වෙබ් අඩවිය මගින් පාරිභෝගික ඇණවුම් 17 ක් පමණක් ලැබී තිබුණි. 2025 අප්‍රේල් 21 වන දින වන විට මෙම වෙබ් අඩවිය මගින් භාණ්ඩ අලෙවිය නතර කර තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ පවතින ගැටළු පිළිබඳව සාකච්ඡා කල අතර මේ සම්බන්ධව ව්‍යවසායක සංවර්ධන අංශය මගින් වඩාත් ඵලදායි ක්‍රමයක් ක්‍රියාත්මක කරමින් පවතී. | වෙබ් අඩවිය භාණ්ඩ අලෙවිය සඳහා භාවිතා කිරීමට සැලසුම් සහගතව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2016 අගෝස්තු 17 දින අමප/16/1424/723/039 දරන | වර්තමානය වන විට මෙම රොබෝ මධ්‍යස්ථානයේ ඉදිරි කටයුතු | ව්‍යාපෘතිය තුළින් අපේක්ෂිත අරමුණ |

| | | |
|---|---|---|
| අමාත්‍ය මණ්ඩල තීරණය මගින් රජයේ දායකත්වයක් සහිතව නවබිම පෙර වැඩුම් මධ්‍යස්ථානයේ පිහිටවූ රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ඨතා මධ්‍යස්ථානය වෙනුවෙන් ගොඩනැගිලි නවීකරණය, වැටුප් හා වේතන ලෙස රු.මිලියන 51 ක් වැයකර තිබුණු අතර 2018 හා 2019 වර්ෂයන්හිදී රු.මිලියන 35 ක් වටිනා රොබෝ තාක්ෂණික උපකරණ ස්ථාපිත කර තිබුණි. එසේ වුවද අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවාගෙන කටයුතු ආරම්භ කර නොතිබූ මෙම ව්‍යාපෘතිය සඳහා 2023 වර්ෂයේදී සපයන ලද IRB 2600 welding power source සහ Reproving of 4 existing Robot cell උපාංග හා ඉංජිනේරුවන් පුහුණු කිරීම සහ වෙනත් වියදම් සඳහා රු.5,164,149 ක් වැයකර තිබුණි. කෙසේ වුවද ශ්‍රී ලංකාවේ කර්මාන්ත වැඩි දියුණු කිරීම හා සංවර්ධනයට සහාය වීමේ අරමුණින් ආරම්භ කර තිබූ මෙම ව්‍යාපෘතිය 2024 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මකව නොපැවතුණි. | සම්බන්ධයෙන් වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා දී ඇති අතර එහිදී ලැබෙන නිර්දේශ පරිදි කටයුතු කිරීමට අදහස් කර ඇත. | ඉටු කර ගැනීම සඳහා සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික ශිල්ප සභාව විසින් මණ්ඩලයට අයත් මාතර වැඩහල වෙත යන්ත්‍ර 3ක් සකස් කිරීමට භාරදී 2021 වර්ෂයේ දී රු.3,850,740ක් ගෙවීම් කර තිබුණ ද, මා වේවැල් කැලයෙන් ඇදීම සඳහා වූ රු.351,000 ක් වටිනා යන්ත්‍රය හැර අනෙකුත් යන්ත්‍ර දෙක නිමකර 2025 අප්‍රේල් 08 වන විටත් ශිල්ප සභාවට භාර දී නොතිබූ අතර මාතර වැඩහල 2024 අප්‍රේල් 17 දින සිට වසා දමා තිබුණි. | මෙම වේවැල් යන්ත්‍ර මෙතෙක් දේශීය වශයෙන් නිෂ්පාදනය කර නොමැති නිසාත් ආනයනය කිරීම සඳහා යම් යම් ගැටළු සහගත තත්ත්වයන් රට තුළ පැවති හෙයින් ද මෙම යන්ත්‍ර දැනට ලංකාවේ භාවිතා නොවන නිසාත් අළුතින්ම සකස්කළ යුතු බැවින් පරීක්ෂණ මට්ටමින් සකස්කරමින් යායුතු නිසාත් ප්‍රමාදවීමක් සිදුවිය. මේ වනවිට වැඩ අවසන් කර ඇති අතර පරීක්ෂණ මට්ටමේ ඇත. 2024 පෙබරවාරි මාතර පොදු සේවා මධ්‍යස්ථානය වසා දමා මෙම මා වේවැල් යන්ත්‍රයේ වැඩ ඇණවුම් සම්පූර්ණ කිරීමට හැකිවන පරිදි එම යන්ත්‍රය සමඟ යන්ත්‍ර ශිල්පී, | භාරගත් ඇණවුම සම්පූර්ණ කර දීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | පැස්සුම්කරු හා ඉංජිනේරු ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත කරන ලදි. යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය සාර්ථක වීමෙන් අනතුරුව කර්මාන්තයේ නියැලෙන අය සඳහා ලබා දීමට කටයුතු කරමි. එබැවින් මේ සඳහා වැයවන මුදල් වෙනුවෙන් 25% ක් අඩු කර ඉතිරි මුදල් නැවත ජාතික ශිල්ප සභාවට ලබාදීමට තීරණය කර ඇත. | |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලය සතු කාර්මික ජනපද 17 හි පැවතුණු බිම් කොටස් 803 කින් අක්කර 07 කට ආසන්න වපසරියක් ඇති බිම් කොටස් 57ක් කර්මාන්තකරුවන්ට බෙදා දී නොතිබීමෙන් නිෂ්කාර්යව පැවතුණි. 2024 දෙසැම්බර් 31 දිනට කාර්මික ජනපදවල පැවති කර්මාන්ත ශාලා 27ක් ක්‍රියාත්මක නොවී වසා දමා තිබූ අතර ඒවා වෙනත් කර්මාන්තකරුවන්ට බෙදා දීමට ද කටයුතු කර නොතිබුණි. කාර්මික ජනපද 04 ක බිම් කොටස් 23 ක් තුල අනවසර පදිංචිකරුවන් පදිංචි වී තිබුණි. | ගාල්ල ඇල්පිටිය ස්ථාපිත කර ඇති අක්කර 21 කින් යුත් කාර්මික ජනපදයේ B කලාපය යටිතල පහසුකම් සංවර්ධනය කර නව ආයෝජකයින් 12 දෙනෙකු වෙත පවරාදී ඇති අතර ඉන් කර්මාන්ත 05 ක මූලික ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත. වසා දමා ඇති කර්මාන්ත නැවත ආරම්භ කිරීමට හෝ නව ආයෝජකයන් වෙත පවරාදීමට අදාළ කටයුතු මේ වන විටත් සිදුකරමින් පවතී. අනවසර පදිංචි ඉවත් කිරීම් සඳහා ගතයුතු ක්‍රියාමාර්ග හා උපදෙස් ලබාගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත | මණ්ඩලය සතු කාර්මික ජනපද වල පිහිටි ඉඩම් ඵලදායීව භාවිතා කිරිමට සැලසුම් සහගතව කටයුතු කළ යුතුය. බිම් කොටස්වල උපරිම භාවිතය තහවුරු කළ යුතුය. |
| (ආ) | 2024 දෙසැම්බර් 31 දිනට ක්‍රියාකාරි සැලැස්ම අනුව අංශ 07ක් මඟින් ඉටු කර ගැනීමට සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් 75 ක් අතුරින් ක්‍රියාකාරකම් 19ක් අදාළ අංශ විසින් ඉටු කර නොතිබුණි. | මේ තත්ත්වය ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රායෝගික තත්වයන් සලකා බලා සැලසුම් සකස් කළ යුතු අතර සැලසුම් කරන ලද කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කළ යුතුය. |

**3.4 මතභේදයට තුඩු දෙන ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන ආහාර රසායනාගාරය සඳහා ප්‍රතීතන සහතිකය සහ ISO තත්ත්ව සහතික ලබා | 2025 වර්ෂයේ ප්‍රතීතන සහතිකය ලබා ගැනීමට කටයුතු කරමින් පවතින අතර අවශ්‍යා සේවක මණ්ඩලය අනුමත කර ගැනීමට කළමණාකරණ සේවා | ආහාර රසායනාගාරය සඳහා ප්‍රතීතන සහතිකය සහ ISO තත්ත්ව |

| | | |
|---|---|---|
| ගැනීමට අපොහොසත් වී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ රසායනාගාර පරීක්ෂණ 1146 ක් සිදුකර තිබුණද මෙම රසායනාගාර පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම සඳහා සුදුසුකම් සහිත බලයලත් නිලධාරියෙකු අනුමත කාර්යමණ්ඩලය තුළට ඇතුළත් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් උපදේශකයින් විසින් අදාළ පරීක්ෂණ වාර්තා නිකුත් කර තිබූ බවට නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත. | සහතික ලබා ගතයුතු අතර රසායනාගාර පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම සඳහා සුදුසුකම් සහිත බලයලත් නිලධාරියෙකු අනුමත කාර්යමණ්ඩලය තුළට ඇතුළත් කර ගත යුතුය. |

### 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 වර්ෂයේදී රු.9,318,026 ක මුදලකට පැලියගොඩ රබර් සංවර්ධන හා සේවා මධ්‍යස්ථානය සඳහා මිලදී ගෙන තිබූ ඉන්ජෙක්ෂන් මෝල්ඩිං යන්ත්‍රයක් මිලදී ගත් දින සිට පුහුණු ලාභීන් 28 දෙනෙකුට පමණක් පුහුණුව ලබා දී තිබූ අතර, 2020 වර්ෂයේ සිට අක්‍රීයව පැවතුණි. | මෙම රබර් ඉංජෙක්ෂන් මෝල්ඩින් යන්ත්‍රය 2021 වන විට පැවති දෝෂ සහගත තත්ත්වය යථා තත්වයට පත්කර ඇත. යන්ත්‍රය නිෂ්පාදන කටයුතු සඳහා සුදුසු මට්ටමේ පවතීදැයි පරීක්ෂා කිරීමට පෞද්ගලික ආයතනයක සහය ලබා ගැනීමට අපේක්ෂා කරයි. | මිලදී ගත් වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව අදාළ අරමුණු සඳහා භාවිතා කළ යුතු අතර නිසි පරිදි නඩත්තු කල යුතුය. |

### 3.6 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අච්චුවේලි කාර්මික ජනපදයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු.36,256,896ක (VAT රහිත) කොන්ත්‍රාත්තුවක් 2018 අගෝස්තු 30 දින ජාතික යන්ත්‍රෝපකරණ දෙපාර්තමේන්තුව වෙත පිරිනමා එහි වටිනාකමෙන් සියයට 20 ක එනම් රු.7,251,379ක අත්තිකාරම් අවස්ථා 2කදී ලබා දී තිබුණි. ගිවිසුම ප්‍රකාරව ඉදිකිරීම් කටයුතු 2018 දෙසැම්බර් 01 දින අවසන් කිරීමට නියමිතව තිබුණ | ගිවිසුම්ගත කාලසීමාව ඉක්මවා යනතුරු කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම්වල ප්‍රගතියක් දක්නට නොලැබුණු බැවින්, නීත්‍යානුකූලව කටයුතු කිරීම ආරම්භ කර ඇත.<br>රාජ්‍ය ආයතන අතර නෛතික ක්‍රියාමාර්ග ගැනීමේ දී අමාත්‍ය මණ්ඩල තීරණ අනුව ගැටළුව සම්බන්ධයෙන් සාකච්ඡා සම්මුති ක්‍රම වේදයක් අනුගමනය කරන ලෙස අමාත්‍යාංශය දන්වා ඇත. ඒ අනුව අමාත්‍යාංශ ලේකම් මහින් මෙම ගැටළුව විසඳා ගැනීමට අදාළව සහයවන ලෙස ඉල්ලා | අදාළ දෙපාර්තමේන්තුව වෙතින් ඉදිකිරීම් කටයුතු සිදු කර ගැනීම හෝ අත්තිකාරම් මුදල නැවත අයකර ගැනීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ද 2025 අප්‍රේල් 08 වන විටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණු අතර ගෙවන ලද අත්තිකාරම් මුදල නැවත අයකර ගැනීමට ද මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | ග්‍රාමීය නිවාස, ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් කර ඇතත් ආයතන මට්ටමින් සාකච්ඡා කර අවසන් තීරණයකට එළඹීමට මේ වන තෙක් අපොහොසත් වී ඇත. | |

**3.7 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව වෙළඳපොල මිල සැදහුම් ක්‍රමය අනුගමනය කරමින් මිල කැඳවුම් 05 ක් ඉක්මවා සිදු කරන රුපියල් මිලියන 10 ඉක්ම වූ ප්‍රසම්පාදනයන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මඟින් සිදු කළ යුතු වුවද ඊට පටහැනිව මුළු ප්‍රසම්පාදන වටිනාකම රු.20,555,200 ක් වූ විද්‍යුත් වාණිජ්‍ය වෙබ් අඩවියක් සහ ජංගම දුරකථන යෙදවුමක් සංවර්ධනය කිරීමේ කාර්යය උප කාර්යයන් කිහිපයකට වෙන් කර දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවක් මඟින් ප්‍රසම්පාදනය සිදුකර තිබුණි. | පසුව පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව වෙළඳපළ මිල සැදහුම් ක්‍රමය අනුගමනය කරනු ලබන රුපියල් මිලියන 10 ඉක්ම වූ ප්‍රසම්පාදනයන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මඟින් සිදු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) විසින් 2009 දෙසැම්බර් 02 දින නිකුත් කරන ලද රාජ්‍ය ප්‍රතිපත්තියෙහි 020101 උප වගන්තිය ප්‍රකාරව තොරතුරු පද්ධති (IS), ICT උපකරණ මෘදුකාංග හා මෘදුකාංග සංවර්ධනය සහ උපදේශන සේවාවල කරනු ලබන මිලදී ගැනීම් මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන අංශය විසින් නිකුත් කරන ලද ප්‍රසම්පාදන අත්පොත සහ මාර්ගෝපදේශවලට අනුකූලව සිදුකළ යුතු බව දක්වා තිබුණ ද, මණ්ඩලයේ මානව සම්පත් කලමනාකරණ පද්ධතිය | පසුව පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | තොරතුරු පද්ධති (IS), ICT උපකරණ මෘදුකාංග හා මෘදුකාංග සංවර්ධනය සහ මිලදී ගැනීම් මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ප්‍රසම්පාදන අත්පොත සහ මාර්ගෝපදේශවලට අනුකූලව සිදුකළ යුතුය. |

ඕනෑම ස්ථානයක සිට පරිහරණය කිරීම සඳහා Cloud System සේවාව මිලදී ගැනීම වෙනුවෙන් ඉහත විධිවිධාන අනුගමනය නොකර පෞද්ගලික සමාගමක් තෝරා ගෙන 2024 ජූලි 01 වනදා සිට 2025 මැයි 31 දක්වා රු.4,638,887 ක් ගෙවීම් කර තිබුණි.